# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,640 — 1959 ජනවාරි 16 වැනි සිකුරාද — 16.1.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)**


# IV වැනි කොටස—පළාත් පාලනය

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැළපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 51 | මාගී කොමිට් දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 52 |


# අතුරු ව්‍යවස්ථා

## කොළඹ නගර සභාව

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (334 පරිච්ඡේදයේ) 4 වැනි වගන්තිය යටතේ සහ 1927 අංක 29 දරණ නගර සභා ආඥාපනතේ 277 වෙනි වගන්තිය යටතේ ඒ සඳහා බලයලත් නිලධාරි තැන වන කොළඹ නගර සභාවේ විශේෂ කොමසාරිස්වරයා විසින් කොළඹ නගර සභාව සඳහා සම්පාදිත අතුරු ව්‍යවස්ථාවයි.

බී. ඒ. ජයසිංහ,
කොළඹ නගර සභාවේ විශේෂ කොමසාරිස් තැන.

1959 ජනවාරි මස 9 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

වර්ෂ 1905 ඔක්තෝබර් මස 20 වෙනි දින අංක 6,080 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (1906 අප්‍රේල් මස 20 වැනි දින අංක 6,116 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ප්‍රකාශනයෙන් සංශොධිතවූ) අතුරු ව්‍යවස්ථා පිළිබඳ 5 වැනි පරිච්ඡේදයේ හතර වැනි අතුරු ව්‍යවස්ථාවෙහි "හය" යන වචනය යෙදෙන සෑම තන්හිම "හතර" කියා යෙදීමෙන් යථොක්ත ව්‍යවස්ථාව මෙයින් සංශොධනය කරණු ලැබේ.


51—ජේ. ඇන්. බී 10836—3,271 (1/59)
F 1


ඇල්.ජී.බී/ජීජේ 9/2ඒ.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ මීගම-ඉත්තපාන-වැලිපැන්න ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, වර්ෂ 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනු ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඩී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථිර ලේකම් තැන.

1958 දෙසැම්බර් 31 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

1955 හේ මැයි මස 27 වැනි දින අංක 10,799 දරණ ගැසට් පත්‍රයේ පළවූ අප්‍රසන්නවූ හා අන්තරාදායකවූ කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, එහි (අ) ඡේදයේ (19) වැනි කාරණය එක්කම ඊළඟට පහත සඳහන් කාරණා යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(20) කබුක්ගල්, බොරළු හෝ කළුගල් ලබාගැනීම සඳහා ගල් වලවල් කැපීම;

(21) භූමිතෙල් ගබඩාවක් තබාගැනීම."

ඇල්.ජී.ඩී.—ජී.ඊ 14/34.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල-මාබෝදලේ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

### ගොඩනැගිලි හා තාප්ප තැනීම

1. (i) කිසිවකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(ඒ) ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(බී) යථා කාලයේ දී ගම්බද පාරක් බවට පත්කරනු ලැබිය හැකියයි කාරක සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(සී) මේ අතුරු ව්‍යවස්ථාවේ (සී) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිර වූ ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත, අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

(ii) කිසිවකු විසින් ලියවිල්ලකින් වූ දන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම පාරක් හෝ මාවතක් හෝ දෙවට පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාරක සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ;

"කාරක සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ;

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ;

"ගම් ප්‍රදේශය" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ උඩුගම්පොල-මාබෝදලේ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ;

"ගම්බද පාර" යනුවෙන් ගම්කාරක සභාව මගින් නඩත්තු කර ගෙන යනු ලබන්නාවූ ද පළලින් අඩි නවයකට වඩා අඩු නොවූද පාරක් අදහස් කරනු ලැබේ;

"ගම්බද මාවත" යනුවෙන් ගම්කාරක සභාව විසින් නඩත්තු කර ගෙන යනු ලබන්නාවූද, පළලින් අඩි හයකට වඩා අඩු නොවූද අඩි නවයකට වඩා අඩුවූද පාරක් අදහස් කරනු ලැබේ.

ඇල්.ඩී.—බී 7/47.

ඇල්.ජී.ඩී.—ජී.අයි. 14/11 ඊ.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපලාතේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ උඩපලාත ගඟපහල ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹදීය.

### තොටුපළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1. මහවැලි ගඟ හරහා පහත දැක්වෙන තොටුපල් මෙයින් පිහිටවනු ලැබේ:—

(අ) මොරේවක හා ඇල්පිටියේ ගම මැද පාර ගඟට වැටෙන මහවැලි ගං ඉවුරේ ස්ථානයක් අතර ඇල්පිටියේ ගහේවත්තේ තොටුපල;

(ආ) එකී ගං ඉවුරේ ඉහතකී ස්ථානයත් උඩෝවිට ගන්නිලේගෙදර වත්තත් අතර ඇල්පිටියේ පුස්සේතොට තොටුපල;

(ඇ) ඉහතකී උඩෝවිට ගන්නිලේගෙදර වත්තත් කහටපිටියත් අතර උඩෝවිට හකිරිල්ලේවෙලේ තොටුපල.

2. ඇල්පිටියේ ගහේවත්තේ තොටුපල, ඇල්පිටියේ පුස්සේතොට තොටුපල සහ උඩෝවිට හකිරිල්ලේවෙලේ තොටුපල නමැති තොටුපල්වල ගාස්තු එකතු කිරීමට කාරක සභාවෙන් විධිවූ පරිදි බලය පවරන ලද අය විසින් පත්කර තිබෙන තොටියෙක් නොවූ වෙනත් කිසිවකු විසින් මහවැලි ගඟ හරහා ඇල්පිටියේ ගහේවත්තේ තොටුපල, ඇල්පිටියේ පුස්සේතොට තොටුපල සහ උඩෝවිට හකිරිල්ලේවෙලේ තොටුපල යන තොටුපල්වල සිට ගඟ් ඉගලට සහ යගලට සැතපුම් බාගයක් ඇතුළත යම් ඔරුවකින් හෝ වෙනත් ඔරු පාරු විශේෂයකින් හෝ කිසිමු මගියෙකු, බඩු බාහිර, රථවාහනයක් හෝ සතෙකු යම් ගාස්තුවකට හෝ පාරිතෝශක මුදලකට හෝ නොමිලයේ හෝ එගොඩ මෙගොඩ නොකළ යුතුය.

3. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් එක් එක් තොටුපලවල් සෑදීම හා නඩත්තු කරගෙනයාම පිළිබඳ වියදම් කාරක සභාව විසින් දැරිය යුතුය.

4. මේ අතුරු ව්‍යවස්ථාවල කාරක සභාව යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ උඩපලාත ගඟ පහළ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ.

# විවිධ දන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කාරක සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුඬව කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්කාරක සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ, 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඊ. ඕ. කේ. සබූර් මොහිදීන් ... පොල්ගහයාය, නාරම්මල | සියඹලාගස්කොටුවේ මීගහමුල වත්තේ පිහිටි ගෙය | හරක්මස් හා එළුමස් |

ඒ. ට්. සෝමරත්න,
හොරොම්බාව ගම්කාරක සභාවේ සභාපති තැන.

1959 ජනවාරි 9 වන දින,
හොරොම්බාව ගම්කාරක සභා කාර්යාලය,
ගොඩවෙල, කටුපොත.

## නුවරඑළිය කඩවත් සතර ගම්කාරක සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1959යේ වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬව නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය කඩවත් සතර ගම්කාරක සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනතේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. වයි. ඇම්. ඇස්. සේගු මොහමඩ් | අංක 187, කඳපොල | එළුමස් |
| 2. වයි. ඇම්. ඇස්. සේගු මොහමඩ් | අංක 188, කඳපොල | හරක්මස් |
| 3. වයි. ඇම්. ඇස්. සිකන්දර් | අංක 186, කඳපොල | හරක්මස් |

එච්. පී. ඇස්. නානායක්කාර,
නුවරඑළිය කඩවත් සතර ගම්කාරක සභාපති තැන.

ගම්සභා කාර්යාලය,
නානුඔය, 1959. 1. 2.

## අම්බලන්ගොඩ නගර සභාව

අම්බලන්ගොඩ නගර සභා සීමාව තුළ පිස්සු බලු රෝග භීතියක් පවතින හෙයින් පිස්සු බලු රෝග ආඥාපනතේ 11 වෙනි ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනුයේ පෞද්ගලික මිදුලක හෝ ගෙවත්තක නොවන මෙම නගර සභා සීමාව තුළ පිහිටි ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ සිටින නොබඳිනා ලද දක්කා ගෙන නොයන ලද හෝ ඕනෑම බල්ලෙකු හෝ බැල්ලියකු හෝ මා විසින් ලියවිල්ලෙන් බලය පවරන ලද කෙනෙකු විසින් එවේලෙහිම විනාශ කිරීමට භාජන වන බවයි.

මේ ප්‍රකාශය කලින් අවලංගු කරන්නට නොයෙදුනොත් 1959 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලංගු වේ.

සැම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

1959 ජනවාරි මස 6 වෙනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.